සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

09 ශ්‍රේණිය

# චිත්‍ර කලාව

කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

- පහත දක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01 ඉහත රූපයෙන් නිරූපණය වන්නේ ............................................................ නම් කලා කෘතියයි.

02 මෙම කලා කෘතිය අයත්වන යුගය ............................................................වේ.

03 කලා කෘතිය සෑදීම සඳහා යොදාගෙන ඇත්තේ ........................................ මාධ්‍යයයි.

04 පැතිකඩෙහි දක්නට ලැබෙන ගජසිංහ රූපය ...................................................... ශිල්ප ක්‍රමයට ඉස්මතු කර ඇත.

05 මෙම කලා නිර්මාණය සැකසීම සඳහා මකර කටින් නික්මෙන ............................................................ යොදාගෙන ඇත.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍යවලට හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

06 කාන්තා රූප 5 ක් ගලපා සාදා ඇති මෝස්තරය ........................................ නමින් හඳුන්වයි.

07 ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කරන ලද ශිල්පියා ලෙස ........................................ පිළිගැනේ.

08 පාර්ලිමේන්තු රැස්වීමක් ආරම්භයේ දී කථානායකවරයා සභා ගැබට පිවිසිනුයේ ........................................ රැගත් චේත්‍රධාරියා පෙරටු කොටගෙන ය.

09 බන්දුල හරිස්චන්ද්‍ර නම් චිත්‍ර ශිල්පියා විසින් දිනමිණ පුවත්පතට අඳින ලද පළමු ජාතක කතාව ............................................................ නම් වේ.

10 කවියකට, කෙටි කථාවකට අර්ථය වඩාත් පැහැදිලි වනසේ අඳින ලද චිත්‍ර හඳුන්වන්නේ ............................................................ යන නමිනි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 අනුරාධපුර යුගයට අයත් හොඳම මුරගල හමුවන්නේ,

(1) බිසෝමාළිගය අසලින් ය. (2) රත්න ප්‍රාසාදය අසලින් ය.

(3) රුවන්මැලි සෑය අභියසින් ය. (4) මහසෙන් රජ මාළිගය අසලින් ය.

12 මිනිසුන් විසින් ඔසවාගෙන යනු ලබන හින්දු ආගමට අයත් කැටයම් සහිත සත්ව වාහන නිර්මාණයේදී කුදිරෙයි වාහනම් යනුවෙන් නිර්මාණය කර ඇති සත්ව රථය වන්නේ,

(1) සිංහ රථයයි. (2) අශ්ව රථයයි. (3) මොණර රථයයි. (4) හංස රථයයි.

13 වෙස්මුහුණු වර්ණ කිරීමට ප්‍රථම සුදු පැහැති මූලික ආලේපනයක් තවරාගනු ලැබේ. මෙය හඳුන්වනු ලබන්නේ,

(1) වෛති ගෑම යනුවෙනි. (2) අල්ලියාදු ගෑම යනුවෙනි.

(3) මූලික වර්ණ ගෑම යනුවෙනි. (4) කිරි හින්දවීම යනුවෙනි.

14 පොළොන්නරු යුගයට අයත් වාහල්කඩ නිර්මාණය දක්නට ලැබෙන ස්ථානය නම්

(1) පොළොන්නරුව ථූපාරාමය දාගැබෙහිය (2) පොළොන්නරුව කිරි වෙහෙරෙහිය

(3) සත්මහල් ප්‍රාසාදයෙහි (4) පොළොන්නරු රන්කොත් වෙහෙරෙහිය

15 ඇත් සොඬ, සිංහ පාද, ඌරු කන්, කිඹුල් දත්, මදුරු ඇස් යන සත්ව රූපයන්ගේ කොටස් ගෙන නිර්මාණය කරන ලද සත්ව රූපය වන්නේ,

(1) ඇත් කඳ ලිහිණියා (2) කිහිඹි මුහුණ (3) හේරුණ්ඩ පක්ෂියා (4) මකර රූපය

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති රූප සටහන්වලට ගැලපෙන අක්ෂරය A, B, C, D, E වශයෙන් යොදන්න.**

16  (......................)  A

17  (......................)  B

18  (......................)  C

19  (......................)  D

20  (......................)  E

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති වචනය අර්ථය ගන්වන පරිදි වාක්‍යයක් ලියන්න.**

21 ඝන කැපුම ..........

22 පර්යාවලෝකනය ..........

23 අර්ධ උන්නත ..........

24 වෘෂභ කුඤ්ඤජය ..........

25 පේශා වළලු ..........

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති රූප සටහන් ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න.**



F G H I J

26 F අක්ෂරයෙන් පෙන්වා ඇත්තේ මකර තොරණයෙහි මධ්‍යයේ දක්නට ඇති සම්ප්‍රදායික මෝස්තරයකි. එය හඳුන්වන නම කුමක් ද? ..........

27 G අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති කලා කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශය කුමක් ද?

..........

28 H අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති රූපයේ හොඳම නිර්මාණය හමුවන ස්ථානය කුමක් ද?

..........

29 I අක්ෂරයෙන් දක්වෙන්නේ පිත්තල කර්මාන්තයේ නිර්මාණයකි. බුදු පිළිම නිර්මාණයේ දී යොදාගනු ලබන ශිල්ප ක්‍රමය කුමක් ද? ..........

30 J අක්ෂරයෙන් දක්වා ඇත්තේ උද්භිත වර්ගයට අයත් මෝස්තරයකි. මෙය නම් කරන්න.

..........

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

31 ජාතික කොඩියේ බෝපත් හතරින් නිරූපණය වන අර්ථය කුමක් ද? ..........

32 වේල් කරත්තය හින්දු ආගමේ දක්නට ලැබෙන අතර කැරොල් වාහනය කුමන ආගමට අයත්වේ ද?

..........

33 විශාල දාගැබ් සඳහා සතර දිශාවට චෛත්‍යය සතර පැත්තෙන් නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණ අංගය කුමක් ද? ..........

34 පංති කාමරයේ දී පහසුවෙන්ම මූර්තියක් සෑදීම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍යය කුමක් ද?

..........

35 හින්දු කෝවිල්වල ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය කුමක් ද? ..........

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ද ඇති චිත්‍රය ඇසුරු කරගනිමින් පිළිතුරු සපයන්න.



36 ඉහත රූපයෙන් නිරූපණය වන්නේ ........................................................................................ මෝස්තරයයි.

37 මෙම නිර්මාණය අයත්වන සම්ප්‍රධායික මෝස්තර කාණ්ඩය .............................................. සණයට අයත් වේ.

38 මෙම නිර්මාණය සිතුවමක් ලෙසින් හමුවන්නේ ........................................................................ මාළිගයෙනි.

39 මෙවැනිම නිර්මාණයක් ලී මාධ්‍යයෙන් ද කර ඇත. එය හමුවන්නේ ................................................... නම් ස්ථානයෙනි.

40 මෙවැනි සම්ප්‍රදායික සැරසිලි නිර්මාණ වැඩි වශයෙන් බිහිවී ඇත්තේ ........................................... යුගයේදී ය.

---

## II කොටස

- ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.
- දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.
- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.

---

01 අභය භූමියක් නරඹන පිරිසක්

02 ඇලදොලක දිය නාන පිරිසක්

03 නාගරික වෙළඳපොලක්

04 ළමයින්ට සුදුසු ඇඳ ඇතිරිල්ලකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්

05 නවතාවයකින් යුතු වෙස් මුහුණක්

06 ළමා කතාවක තෝරාගත් අවස්ථාවක් චිත්‍රණය කරන්න.

07 ලියුම් රඳවනයක් ලෙස භාවිත කළ හැකි බිත්ති සැරසිල්ලක් (ලකුණු 60 යි)